## ශ්‍රී ලංකා දුම්රිය සේවය

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ලක්හිරු සෙවන නිවාස සංකීර්ණයේ පවතින කඩකාමර බදුලබාදීම සඳහා ප්‍රසම්පාදන කමිටු ලංසු කැඳවීමයි.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් ලක්හිරු සෙවන නිවාස සංකීර්ණයේ පවතින කඩකාමර වසර දෙකක කාලයකට ව්‍යාපාරික කටයුත්තක් සඳහා බදු ලබාදීම පිනිස ලංසු කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන ලංසුපත් කැඳවනු ලැබේ.

| අනු අංකය | කඩකාමර | ප්‍රමානය (වර්ග අඩි) | අවම මාසික බදු මුදල (රු) | ආපසු ගෙවනු ලබන ලංසු බැදුම්කර ඇප මුදල (රු.) |
|---|---|---|---|---|
| 01 | දෙවන මහල | 154 | 5,000.00 | 6,000.00 |
| 02 | තෙවන මහල | 154 | 5,000.00 | 6,000.00 |
| 03 | සිව්වන මහල | 154 | 5,000.00 | 6,000.00 |

**01.සුදුසුකම්**

ලක්හිරු සෙවන නිවාස සංකීර්ණයේ පදිංචි දුම්රිය සේවකයන්ට පමනක් මෙම කඩකාමර බදු ලබාගැනීම සඳහා ඉල්ලුම් කල හැකි අතර, එම සුදුසුකම් සහිත වැඩිම මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්කරුවන්ට උක්ත කඩකාමර බදු ලබාදීමට කටයුතු කරනු ඇත.

**02.ලංසු අයදුම්පත්‍ර ලබාගැනීම**

ටෙන්ඩර් අයදුම්පත් ලියවිලි 2023 මැයි මස 15 වන දින ප.ව. 02.00 දක්වා දුම්රිය වෙළඳ හා අලෙවි කාර්යාලයෙන් ලබා ගත හැක. ඒ සඳහා කොළඹ 10 ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන මුල්‍ය නිලධාරි වෙත ආපසු නොගවනු ලබන ලංසු පෝරම ගාස්තුව ලෙස රු.2,500/- ක මුදලක් ගෙවා ලබා ගන්නාලද ලදුපත දුම්රිය මූලස්ථානයේ නියෝජ්‍ය අධිකාරී (වෙළඳ හා අලෙවි) වෙත ඉදිරිපත් කළ යුතුය. එක් අයෙකු විසින් කඩකාමර කිහිපයක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් ඒ සඳහා වෙන් වෙන්ව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ලංසු පෝරම ගාස්තුවට අමතරව එම ලේඛණයේ දක්වා ඇති පරිදි ආපසු ගෙවනු ලබන ලංසු බැදුම්කරයක්ද ගෙවිය යුතුය.

**03. ලංසු අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම**

ඉහත 02 යටතේ සඳහන් ආකාරයට ලබාගන්නා ලද අයදුම්පත්‍ර මුල් පිටපත හා අනු පිටපත නිසිපරිදි සම්පූර්ණ කර කවර දෙකක බහා මුද්‍රා තැබිය යුතුය. එම කවරවල මුල් පිටපත හා අනුපිටපත ලෙස පැහැදිලිව සඳහන්කළ යුතුය. එම කවර දෙක තනිකවරයක බහා වම් පස ඉහල කෙළවරේ "ලක්හිරු සෙවන නිවාස සංකීර්ණයේ කඩකාමර සඳහා මිල ගණන් කැඳවීම " යනුවෙන් සඳහන් කොට, එම කවරය මුද්‍රා තබා 2023 මැයි මස 16 වන දින ප.ව 02.00 පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, වෙළඳ හා අලෙවි කාර්යාලය, දුම්රිය මූලස්ථානය, ඔල්කට් මාවත, කොළඹ 10 ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ දුම්රිය මූලස්ථාන වෙළඳ හා අලෙවි කළමණාකරුගේ නිල කාමරයෙහි ටෙන්ඩර්පත් බහාලීම සඳහා සකසා ඇති විශේෂ ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ කටයුතු කළ යුතුය. එම වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී ප්‍රමාදවූ හා නැතිවූ අයදුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ.

**04. ලංසු භාරගැනීම හා විවෘත කිරීම**

2023 මැයි මස 16 වන දින ප.ව. 02.00 ට ඉහත 03 ඡේදයේ දක්වා ඇති පරිදි වෙළඳ හා අලෙවි කාර්යාලයේදී අයදුම්පත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට හෝ සහභාගී වීමට ඉඩදෙනු ලැබේ.

**05.** දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**06.** ලංසුකරුවන්ට වැඩි විස්තර අවශ්‍ය නම් දුරකථන අංක :- 011-2421281 – (දිගු අංකය -8235) ෆැක්ස් :- 011-2431909 හරහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ වෙළඳ හා අලෙවි කාර්යාලය වෙතින් ලබාගත හැක.

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,<br>
වෙළඳ හා අලෙවි කාර්යාලය,<br>
දුම්රිය මූලස්ථානය, ඔල්කට් මාවත, කොළඹ 10.